සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

| 21 | S | I |
|---|---|---|

## Grade 11 – Third Term Evaluation –October 2020
## තෙවන වාර පරීක්ෂණය – 2020 –11 ශ්‍රේණිය

කාලය : පැය 2
Time: 2 hours

# සිංහල භාෂාව හා සාහිත්‍යය – I
# Sinhala Language & Literature – I

- **අංක 1-3 තෙක් ඇති එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අදහසට වඩාත් සමීප අදහස තෝරන්න.**

(01) තාත්තා ගෙදර ඇවිත් අම්මාට පැවසුවේ ''අද නම් හොඳ අකලංචියක් වුණේ යැයි.
1. නොසිතු විදියේ දෙයක් සිදුවී වැඩ අවුල් වීම.
2. නොසිතු විදියේ සතුටක් ලැබීම.
3. නොසිතු ආකාරයේ දුකකට පත්වීම.
4. යම්කිසි දෙයක් යාන්තමට කිරීම.

(02) අල්ලපු ගෙදර අයට අපේ වැඩවලට "ඇහේ කටු අනිනවා වගේ" යැයි මාමා පැවසීය.
1. ඊර්ෂ්‍යා කිරීම.
2. ඇහැට රිදුම් දීම
3. ඇසේ කටු අයින් කිරීම.
4. සතුටට පත්වීම

(03) ඇමතිතුමාට ලබා දෙන සියලුම ලිපි හමස් පෙට්ටියට වැටෙන බව ලිපිකරුවා මහජනයාට පවසයි.
1. ක්‍රියාත්මක නොකිරීම.
2. ක්‍රියාත්මක කිරීම.
3. විශාල පෙට්ටියකට වැටීම.
4. වැදගත් ලිපි වැටෙන පෙට්ටිය.

- **අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(04) සීතාවක යුගය දේශපාලන මෙන්ම සමාජාර්ථික හා සංස්කෘතික .................. කාලයක් සේ පිළිගැනේ.
1. සංවර්ධන 2. පරිහාණි 3. විප්ලව 4. ස්වයංපෝෂිත

(05) .................. ඉක්මවා ගිය තත්ත්වයක් විචාරකයන් විසින් අනතර්ඥානය යනුවෙන්ද හඳුන්වයි.
1. තර්කඥානය 2. විභවඥානය 3. අවබෝධඥානය 4. විකල්පඥානය

(06) එක් සුවිශේෂ සිදුවීමක් වටා ගොඩනැගෙන .................. වන එහි විවිධ මානුෂීය සංසිද්ධි සංගෘහිත වේ.
1. ගද්‍යමයක් 2. ආඛ්‍යාතයක් 3. සාහිත්‍යාංගයක් 4. වින්‍යාසයක්

(07) අකාරාදි පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.
1. ගිරි සංදේශය, බුත්සරණ, බුදුගුණාලංකාරය, සඳකිඳුරුදා
2. සැළලිහිණිය, අමාවතුර, පූජාවලිය, බුත්සරණ
3. මඩොල්දූව, විජයබා, රන්පලස, ගම්පෙරළිය
4. කාව්‍යාලංකාරය, බෝධිදෑම, ජාතක කතා, ධර්මාලංකාර

(08) සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. සමස්ත, ශීඝ්‍රගාමී, මර්දනය, නීත්‍යානුකූල
2. ප්‍රාසාංගික, අත්‍යාවශ්‍ය, වර්ධනය, විමර්ශණ
3. විද්‍යාමාන, ව්‍යූහය, රිද්මයානුකූල, වෛරාවණ
4. ඓක්‍ය, ඓතිහාසික, පිළිවෙළ, පිළියෙළ

(09) එක් එක් වචනයේ පළමු අකුරෙහි රකාරාංශය, ගැටය සහිත ඇලපිල්ල, දීර්ඝ පාපිල්ල, කෙටි ඇදය.
1. භ්‍රමණය, කෘත්‍රිම, පැහැය, රුපියල
2. ප්‍රමාණය, ගෘහය, රූමතිය, රැකියාව
3. ප්‍රාණවාචී, ගෘෂා, දූර්ජන, පැලදිග
4. ක්‍රමය, සෘණ, කෑත්ත, කැරලා

(10) ශාක්‍යසිංහ අයත් වන්නේ,
1. ප්‍රථමා විභක්ති සමාසය
2. අන්‍යාර්ථ සමාසය
3. උපමා අපර විශේෂණ සමාසය
4. උපමා පූර්ව විශේෂණ සමාසය

(11) උක්ත නාම පද පමණක් යොදා ඇති වරණය තෝරන්න.
1. දරුවෙකු, මම, ගැහැනියක්, ළමයෙකු
2. ගංගාවෝ, හස්හු, තාරකාවෝ, මල් හු
3. තාරකාවෝ, ශිෂ්‍යයෝ, ඇතැමුන්, මිනිසෙක්
4. ගංගාවෝ, යන්ත්‍රහු, දැරියක්, අප

(12) සිඟිති යන පදය ප්‍රත්‍ය හා ප්‍රකෘතිය වෙන් වූ විට නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
1. සිඟ + ඉති 2. සුඟ – ඉති 3. සුගි + ඉති 4. සඟ + ඉති

(13) ඇය නම් ඉතාම ළා බාල තරුණියකි. මෙහි නම් යනු,
1. අවධාරණාර්ථය 2. උපන්‍යාසාර්ථය 3. සමානාර්ථය 4. භාවාර්ථය

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තදකළ ඉරි ඇඳි කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

(14) පහන් වන තුරුම ඉරබටු තරුව පායා තිබෙන හෙයින් අහස ලස්සනය.

1. ඉරටු තරුව 2. සිකුරු තරුව 3. බුද තරුව 4. බ්‍රහස්පති තරු

(15) වෙහෙල් කැල ලතාවකට ගමන් කරති.

1. අශ්ව සමූහය 2. අලි සමූහය 3. මුව සමූහය 4. ගව සමූහය

(16) පූර්ණ නාසික්‍ය අක්ෂරයකි.

1. ඤ් අක්ෂරය 2. ණ - අක්ෂරය 3. (අ)ං අක්ෂරය 4. (අ)ඃ - අක්ෂරය

(17) මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

1. කෘදන්ත - දුවන්නා, කියුම්, රිකිලි, දකින
2. තද්ධිත - දියණියෝ, සුහදතා, පාපිය, මූලික
3. උපසර්ග - පරි, පිහි, වි. අත්
4. නිපාත- බොහෝ, ලු, දක්වා, නොහොත්

(18) දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නොපවත්වා පද පේළිය තෝරන්න.

1. ස්වර, සංයුක්ත ස්වර, ව්‍යඤ්ජන
2. සොයා බලා, ඕපදූප, පින් පව්, බාරහාර
3. සෙල්මුවා, රන්මුවා, රිදීමුවා, පිතිමුවා
4. කිරිබත්, වේපස්, මලවි, තිනෙත්

(19) එක් එක් පද පේළියේ දී ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

1. අනංගයා - මල්සැවි, අහස - නුබ, අශ්වයා - කේසර, අම්මා - ජනනි
2. නෙළුම් - තඹර, ගිමන - සරතැස, උතුම් - අධම, උපත - පහළවීම
3. පුෂ්පදාම - මල්වැල, අලුයම - ප්‍රභාතය, වෛතාලය - ඉක්මන, පාදප - වෘක්ෂය
4. සර්පයෙක් - සපෙක්, නිතර - නිබඳ, සාගර - සින්ධු, වැලි - පුලින

(20) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වර්ණය තෝරන්න.

1. භූමිය - පොළොව, වසුන්දරා, මිහි, සරණි
2. කැලෑව - වල, අරණ, රැකුළ, ළන්ද
3. අශ්ව - තුරඟ, ගජ, හස, සෛන්ධව
4. ස්වරණ - හේම, කාංචන, රන්, කනක

(21) විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

1. ප්‍රවීණ - ආධුනික 2. අඥාන - විදග්ධ 3. අධම - උතුම් 4. පිරිසිදු - සුපිරිසිදු

(22) අසම්භාව්‍ය ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය තෝරන්න.

1. ප්‍රදර්ශනය නරඹන මිනිස්සු සිය අදහස් දක්වති.
2. මෑණියන් දරුවන්ට උපදෙස් දෙද්දී ඔවුහු අසා සිටියහ.
3. ඔවුහු එතෙර රැකියා කරමින් මුදල් උපයති.
4. මම දිවා ආහාරය ගෙන විවේක ගත්තෙමි.

(23) නිවැරදි අදහස සහිත ප්‍රකාශය තෝරන්න.

1. යටිතොල හා යටිතොල ස්පර්ශයෙන් කණ්ඨජ අක්ෂර උපදී.
2. දෙමාපියෝ වැඩ අරඹා ඇත.
3. අසම්භාව්‍ය ක්‍රියාව කාලාර්ථයෙහි පමණක් යෙදේ.
4. ව්‍යඤ්ජන අක්ෂරයකට ''අ'' ස්වරය එක් වූ විට ''හල්'' ලකුණ ඉවත් වේ.

(24) අර්ධ ස්වර අක්ෂර පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න,

1. ය ර ල ව 2. ග ජ ඬ ඳ ඹ 3. ඞ ඤ ණ න ම 4. ශ ෂ ස හ

(25) දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි පැරණි කාව්‍ය ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය තෝරන්න.

1. දාසවසතර 2. ණකසිමිළුවිය 3. යකශේව්‍යකාරමය 4. රිබාකුරපැම්සිත

- **අංක 26 හා 27 ප්‍රශ්න යටතේ දී ඇති ප්‍රස්තා පිරුළුවලට වඩාත් ගැලපෙන අදහස සහිත වරණය තෝරන්න.**

(26) නිවැරදි දේ නොකොට නිෂ්ඵල අනුවණ ක්‍රියාවල යෙදීම.

1. දේසේ හැටියට බාසේ කිව්වලු
2. අලියන කපොලු තිබේද්දී, කුඹී යන තව් වහනවලු
3. අතිසාරයට අමුඩේ ගහන්නා වගේ
4. දැලි පිහියෙන් බෙල්ල කපනවා වගේ

(27) 1. පාළු ගෙයි වළං බිඳින්නා වගෙයි''

2. කතාවේ තරමට ක්‍රියාවෙන් කටයුතු නොකිරීම
3. විරුද්ධකාරයෝ නැති තැන ස්වාභිමතයට කටයුතු කිරීම
4. නිශ්ශබ්දතාව ආරක්ෂා කළ යුතු නැත එය කඩ කිරීම

(28) $A$ – ක්ෂුධාවෙන් - කුසගිනි නැති

$B$ – ගොන්ගේ - හරක්බාන

$C$ – විලිකුන් - ඉදුණු

$D$ – අවියෝජනීය - වෙන්කළ හැක

$ABCD$ යෙදුම් යුගලය අතුරින් නිවැරදි යුගලය වන්නේ,

1. $A$ හා $B$ පමණි
2. $A$ හා $C$ පමණි
3. $AC$ හා $D$ පමණි
4. $B$ හා $C$ පමණි

(29) පහත සඳහන් වාක්‍ය ලිඛිත ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වාක්‍ය දැක්වෙන වරණය තෝරන්න.

''අපි හොදට පාඩම් කරන්නට ඇති කියල ගුරුතුමිය හිතුවා''

1. අප විසින් හොඳින් පාඩම් කරන ලදහ'යි ගුරුතුමිය සිතුවෝය.
2. අප හොඳින් පාඩම් කළහයි ගුරුතුමිය සිතුවෝය.
3. අප හොඳින් පාඩම් කරන ලදහ'යි ගුරුතුමිය සිතුවාය.
4. අපි හොඳින් පාඩම් කරමු'යි ගුරුතුමිය සිතුවෝය.

(30) $A$ – පර වැඩ ......... ධර්මපාල තුමා සිය ජීවිතය කැප කළේය.

$B$ – එදා ......... අදවනතුරු කිසිවෙක් රැස්වීමට නොපැමිණියහ.

$C$ – ......... සියල්ලෝම සතුටින් විසිරී ගියහ.

$D$ – අම්මා ......... ආදරය ඇති කෙනෙකු තවම හමු වී නැත.

$E$ – තරම් $F$ – පිණිස $G$ – ඉක්බිති $H$ – පටන්

1. $E, F, G, H$
2. $F, H, G, E$
3. $H, G, E, F$
4. $F, E, G, H$

- **අංක 31 හා 32 යටතේ ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තොරන්න.**

(31) 1. අයෙක් අප ගැන වරදවා සිතයි

2. විශාඛා කුමරිය උපාසිකාවක්ද වෙති
3. ගුත්තිල ඇඳුරු සඳ සක්දෙව් පිහිට පැතීය
4. ලේකම් හෝ මම හෝ මුලසුන හොබවමු

(32) 1. දරුවන් සැමදා පරහිතකාමී වීම යෙහෙකි.

2. අපි ඒ නාට්‍ය නරඹා නැත
3. උත්සවයට පැමිණෙන බව අගමැතිතුමා පැවසූහ
4. මිනිස්සු විසින් අප මගහරිනු ලැබේ

(33) දුකට කියන කවි සී පද, ධීවර ගීතය, සූරිය මල වස්සානේ යන පද්‍ය නිර්මාණය කළ ලේඛකයන් වන්නේ,

1. මහගමසේකර කේයස්, විමල් දිසානායක, ගුණදාස අමරසේකර
2. මහගමසේකර කේයස්, පරාක්‍රම කොඩිතුවක්කු, රත්න ශ්‍රී විජේසිංහ
3. මොනිකා රුවන් පතිරණ, රුවන් බන්දුජීව, ඇස්. මහින්ද හිමි, රත්න ශ්‍රී විජේසිංහ
4. ඒ. වී. සුරවීර, ඩබ්ලිව්. ඒ. සිල්වා, අරිසෙන් අහුබුදු, විමල් දිසානායක

(34) 'මිනිහට බඩගිනි නැතිව ඇති මෙච්චර වේලාම සම්ප්‍රදාය කැවා'' යන දෙබස් ඛණ්ඩය ඇතුළත් නාට්‍ය කුමක්ද?
1. තලමල පිපිලා 2. හුණුවටයේ කතාව 3. සිංහබාහු 4. සුහ සහ යස

(35) වතින් සොම් සඳ වූ
රන්ලිය සිරින් බඳ වූ
තෙනෙන් රන් පෙඳ වූ
දියණියන් තම ළගට කැඳවූ

මෙම පද්‍යයේ මුහුණ, ශරීරය, පියයුරු උපමා කොට ඇති නිවැරදි වරණය තෝරන්න.
1. සෞම්‍ය සඳ, රන් පර්වතය, පන්දම
2. සෞම්‍ය සඳ, රන්වැල, රන් පන්දු
3. සෞම්‍ය සඳ, රන්ගස්, රන් පියාපත්
4. සෞම්‍ය සඳ, රන් කාන්තාව, රන් පිළිගු

(36) ''නද පමණින් දැනගත හැකි රිටුන් ඉඳ'' මෙහි ''රිටුන්'' යන වචනයේ අර්ථය,
1. කොවුලා 2. කපුටා 3. මොණරා 4. ගිරවා

(37) පහත සඳහන් කවියේ තුන්වැනි පදය තෝරන්න.

රිවිබිම්බා යුරු රිවිකුල කමලකර
පියුමම්බා හිතොරව රැඳි උරමැදුර
..............................................................................
පැරකුම්බා නරනිඳු සඳ දකු මිතුර

1. මෙම්බා වඩන සඳ පියුම් මනහර
2. මෙනරම්බා හිමි රූ සිරිති මනහර
3. පෙම්බරම්බා වඩන සිතුවිලි පියුමහර
4. රිවිබිම්බා සේම අප සිත් මිතුර

(38) ධීවර භාෂාව ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේදී ''අලුයම්පොළ'' යනු,

1. එළවළු පොළ
2. උදෑසන පොළ
3. මාළු වෙළෙඳ පොළ
4. දුම්රිය පොළ

(39) උඹයි මායි අපි දෙන්නා එකතු වෙලා
කැලේ කපා වල් කොටලා ගිනි තියලා
වැවු කුරැක්කන් ගොබ දැන් කළු ගැහිලා
මොරයි බංඩි මඳ සුළඟට නැමිලා
මෙම කවියෙන් කියවෙන්නේ,

1. සහයෝගීත්වය ගැනය
2. ආත්මාර්ථකාමීත්වය ගැනය
3. බලලෝභීත්වය ගැනය
4. ප්‍රබලත්වය ගැනය.

(40) පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න. රටක් දියුණු කිරීමට එහි වැසියන් නිසි ඉගෙනුමද බුද්ධිමත් බව හා නිරෝගී බවද ලැබූ අය විය යුතුය.
1. නියම ඉගෙනීමත්, බුද්ධියත්, නීරෝගීභාවයත් තිබීම රටක දියුණුවට හේතු වේ.
2. උගත්කම, බුද්ධිය හා නීරෝගීකම් නොමැති නම් රටක් දියුණු නොවේ.
3. රටක් දියුණු වීමට නම් එරට වැසියන්ගේ උගත්කම බුද්දිය හා නීරෝගීභාවය තිබීම සෑහේ.
4. රටවැසියන්ගේ උගත්කම, බුද්ධිය හා නීරෝගීකම රටක දියුණුවට ඉවහල් වේ.

සියලු ම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

| 21 | S | II |
|---|---|---|

## Grade 11 – Third Term Evaluation – October 2020

**තෙවන වාර පරීක්ෂණය – 2020 – 11 ශ්‍රේණිය**

## සිංහල භාෂාව හා සාහිත්‍යය – II
## Sinhala Language & Literature – II

කාලය : පැය 2
**Time: 2 hours**

**ප්‍රශ්න සියල්ලටම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

01) (i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. සිංහල හෝඩියේ ඇතුළත්
(අ) වර්ගාන්තක්ෂර (ආ) ඝර්ෂ
අක්ෂරය බැගින් ලියන්න.

ii. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
ශ්‍රී ලංකාවේ ඩෙංගු උවදුර සීඝ්‍රයෙන් ඉහළ යමින් එහිදී හටගන්නා උණ සඳහා වෛද්‍ය උපදෙස්වලින් තොර ඖෂධ ලබාගැනීම නොකළ යුතුය.

iii. පහත සඳහන් පද විසන්ධි කොට සන්ධියේ නම ලියන්න.
(අ) ඉන්නල (ආ) වියවුල

iv. පහත සඳහන් වාක්‍යයෙහි ඇති උපසර්ග පදයක් සහ නිපාත පදයක් උපුටා ලියන්න.
'සංවිධායකයන් විසින් ආරාධිතයෝ පිළිගන්නා ලදහ'
(අ)......................... (ආ).............................

v. පහත දැක්වෙන පදවලට විරුද්ධාර්තවත් පදය බැගින් ලියන්න.
(අ) අවමන (ආ) සංකෝචනය

vi. පහත සඳහන් අදහස්වලට ගැලපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) ගොඩබිම දෙසට නෙරාගිය මුහුදු කොටස
(ආ) මැනවින් එක්ව බැඳුණු

vii. පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල ඉරි ඇඳි පදඅ යත් වන ක්‍රියාවර්ගය නම් කරන්න.
(අ) <u>කියග</u> මගිය එනු කොහි සිට
(ආ) කියත උන් මෙතෙපල - ආයේය ඇදුරු ගුත්තල

viii. පහත දැක්වෙන වාක්‍ය සදොස්ය.ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) අප යහපත් මිනිස්සු සේ හැසිරෙමු.
(ආ) පැරුන්නෝ ගස් ගල් වන්දනා කළහ'යි බොහෝ දෙනෙකු විශ්වාස කරති.

ix. පහත සඳහන් යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
(අ) නෙත් යුග්මය (ආ) ධූමරිය

x. පහත දැක්වෙන යෙදුම් සඳහා හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ යෙදෙන වචන ලියන්න.
(අ) අළුපොළ (ආ) කුරුලු පාළුව

02) පහත දැක්වෙන (අ),(ආ),(ඉ),(ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 ට නොඅඩු වනසේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) වර්තමානය වන විට ජන සන්නිවේදන හා ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන් හේතුවෙන් දරුවන් හුදකලා තත්ත්වයකට පත්ව සිටිති. දරුවන් තුළ පවතින කියවීමේ ගුණය මේ හේතුවෙන් දිනෙන් දින ඈත් වෙමින් පවති. සෑම අංශයකින්ම දැනුවත් ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස සමාජය යහපත් කිරීමේ කාර්යයට දරු පරපුර ඉදිරියට ගෙනයාම අපගේ යුතුකමකි.

(ආ) මානව අයිතිවාසිකම් හා යුතුකම් යනු එකට බැඳුණු යාවජීව අංග දෙකකි. මේ පිළිබදව සමාජ අවධානය පවතින තරඟකාරීත්වය හේතුවෙන් සමාජයෙන් ගිලිහෙමින් පවති. යුනෙස්කෝ ආයතනය ඇතුළු සංවිධාන රැසක්ම ලොව පුරා පැවතුන ද එය එතරම් ජන සමාජයට මුසුවී නැති තරම්ය. මේ පිළිබදව අවධානය යොමු කිරීම අගනේය.

(ඉ) අතීතයේ සිට පැවත එන බහු සංස්කෘතික අංග රටේ පැවැත්ම ස්වාභාවය ලොවට ගෙනහැරපාන්නා වූ අංගයක් වේ. බහු ආගමික, බහු භාෂාමය, බහු ආකල්ප, බහු හැසිරීම් සංස්කෘතියක් තවත් සංස්කෘතියක් අගය කිරීමට අප පුරුදු පුහුණු විය යුතුය.

(ඊ) අතීතයේ සිට ශ්‍රී ලංකාවේ ස්වයං පෝෂිත වූ රටකි. අතීත රජදරුවන් පවා ඒ සඳහා තම සේවාවන් දියත් කළහ. රටේ ස්වාධීනත්වය රැක ගැනීමට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස ස්වයංපෝෂණය දැක්විය හැක. එකිනෙකා තමාට හැකි පමණින් ආහාර වගාකරන්නේ නම් ආහාර අර්බුධයට ද හය මහත් රුකුලක් වේ.

03) පහත දැක්වෙන ඡේදය වචන 65-75 ත් අතර ගණනකින් යුතුවන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

උතුරු මැද පළාතේ ප්‍රධාන නගරය වන අනුරාධපුරය අවුරුදු 1500ක් පමණ ශ්‍රී ලංකාවේ අගනුවර වශයෙන් පැවතුණි. පණ්ඩුකාභය රජුගේ සිට මිහිදු රජු තෙක් රජුන් සියයකට අධික සංඛ්‍යාවකගේ විජය භූමිය වූ අනුරාධපුරය අපේ සංස්කෘතියේ තෝතැන්න බදු වෙයි. මිහිදු මහ රහතන් වහන්සේ විසින් මෙරටට බුද්ධාගම ගෙන එන ලද්දේ අනුරපුර රජ කළ දෙවන පෑතිස් රජුගේ රාජ්‍ය කාලයේදී ය. ඊට ටික කලකට පසුව සංඝමිත්තා මෙහෙණින් වහන්සේ විසින් ගෙන එන ලද ශ්‍රී මහා බෝධී ශාඛාව රෝපණය කරණ ලද්දේ ද අනුරපුර මහමෙව්නා උයනේය. අප රටේ මුලින්ම තනන ලද විහාරස්ථාන සියල්ලම පාහේ බෝධි ශාඛා රෝපණය කරන ලද්දේ ශ්‍රී මහා බෝධීයේ අංකුරවලිනි.

ශ්‍රී මහා බෝධිය ලොව ඉපැරණිම වෘක්ෂය ලෙස පිළිගැනේ. අපේ රජ කෙනෙකු විසින් තනන ලද මුල්ම චෛත්‍ය ලෙස සැලකෙන ථූපාරාම දාගැබ ද පිහිටා ඇත්තේ අනුරාධපුරයේ ය. එම චෛත්‍ය නිර්මාණය පළ මූලධර්මයටම අනුව යමින් තැනූ රුවන්වැලිසෑය, අභයගිරිය හා ජේතවනාරාමය වැනි විශාල චෛත්‍යයන් ගොඩ නගා ඇත්තේ ද අනුරාධපුරයේය. අපේ වාරිකර්මාන්ත ශිල්පයේ ආරම්භය වූයේ ද අනුරාධපුයයි. අද බසවක්කුලම නමින් හැඳින්වෙන අභය වැව මෙරට තනන ලද මුල් ම වාරිකර්මාන්තය ලෙස සැලකෙන අතර එය පණ්ඩුකාභය රජු විසින් කරවන ලද්දකි. මින් පසුව මහා සාගරය බදු මින්නේරිය වැව, කන්තලේ වැව ආදී වැව් බැදවූ මහසෙන්, ධාතුසේන හා ii වන අග්බෝ වැනි රජවරු අනුරාධපුරයේ රජකළ අය වූහ.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

04) ගසක් නොහැර සුපිපුණු මල් සුවඳ අසා ගනඳුරු
රැසක විලස රොඳ බැඳ යන බමර මුළු හදේ
දෙසන් අතර නොව මුළු ලොව පැතිර පවතින මනහර
වෙසක් මසේ පුණ් පොහෝ දින අදය සිරිසරා

තැන තැන මුළු මුළුව සිටින සාදු නදදී සුරබඹ
බිඳ ගණ කර තිමිර පටල පහල සොමි සදෙව්
සුපිපුණ ලුම්බිණි විශාල සාල නැකතේ විසිතුරු
බිහි වුණ දින අදය අපේ මහරු පින්වත

පෑ තිලෝක ස්වාමි ශ්‍රී ඒ හිමි දිනු දිනේ මේ ජාති අන්ධයෝ දුටහ. චිත්‍ර රූපයන්.

I. මෙහි සඳහන් උත්තමයා බිහි වුණ දිනය වශයෙන් කවි පෙලෙහි සඳයන් වන්නේ කවදා ද?

II. මී මැසි සමූහය උපයා කර ඇත්තේ කුමකට ද?

III. එකී උත්තමයා උපන් දවසෙහි දිව්‍ය බ්‍රහ්ම ආදීන් කුමක් කරමින් සිටි බවක් කියැවේ ද?

IV. මේ දිනයෙහි සිදු වූ ප්‍රාතිහාර්ය කුමක් ද?

V. 'බිඳ ගත කර තිමිර පටල සෙබා සදෙම්' මේ කොටස් හැම පදයකම අර්ථය ඇතුලත් කරමින් එහි තේරුම ඔබේ වචනයෙන් ලියන්න.

05) දික්පිටිගම ඇති පැරණි වෙළඳ පොළ වෙනුවට නවීන වෙළඳ සංකීර්ණයක අවශ්‍යතාව ග්‍රාම සංවර්ධන සංගමයේ ලේකම් කුමාරසිරි ලොකුගෙදර තම ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව වෙත ලිපියක් මගින් කරුණු ඉදිරිපත් කළේය. එහි පහත කරුණු සඳහන්ව තිබුණි.

- ගමේ පවුල් 2000 පමණ සිටින බව.
- දැනට පවතින වෙළඳ පොළ අබලන් වීම.
- ගමේ පාරිභෝගිකයන් ලොකු දුරක් ගෙවා නගරයට යන බව.
- නව වෙළඳ පොළක දැඩි අවශ්‍යතාව.

මෙම ලිපියට ප්‍රාදේශීය ලේකම් එවන පිළිතුරු ලිපිය ලියන්න.

**නැතහොත්**

මහනුවර මාතලේ පාරේ අංක 13 දරණ ස්ථානයේ පදිංචි නාරද ගුණසේකර වන ඔබ පහත දැක්වෙන තනතුර සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇතැයි සළකා අදාළ විස්තර ඇතුළත් කරමින් දැන්වීම්කරු වෙත යැවීමට සුදුසු අයදුම්පතක් සකස් කරන්න.

සහන නිවේදක තනතුරු ඇබෑර්තු

සුදුසුකම්

- අ.පො.ස (උ.පෙළ) සමත් වීම
- වයස අවු 22-25 අතර වීම.
- ස්ත්‍රී / පුරුෂ භේදයක් නැත. නිවේදන කටයුතු පිළිබඳ පළපුරුද්ද ඉතා වැදගත්ය.
- අයදුම් භාරගන්නා අවසන් දිනය 2013.10.15

බඳවා ගැනීම් නිළධාරී,
පීරිස් පාලන අංශය 'සකුරා' ගුවන් විදුලි සේවය.
කොළඹ 05

සියලු ම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

| 21 | S | III |
|---|---|---|

## Grade 11 – Third Term Evaluation – October 2020

**තෙවන වාර පරීක්ෂණය – 2020 –** 11 **ශ්‍රේණිය**

## සිංහල භාෂාව හා සාහිත්‍යය – III

## Sinhala Language & Literature – III

කාලය : පැය 2
**Time: 2 hours**

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ''ඇයි , ටිටර් බලන්න යන කොට ඇඳ ගෙන යන එක?''

(අ) මේ ප්‍රකාශය ඇතුළත් කෘතියේ මුල් කතුවරයා කවුරු ද?

(ආ) ඔහු උපත ලද ස්ථානය කුමක් ද?

(ii) (අ) සිංහබාහු නාට්‍යය රචනා කළ සරච්චන්ද්‍රයෝ සිංහල විචාර කලාව සම්බන්ධයෙන් කුමන ග්‍රන්ථයක් රචනා කළෝ ද?

(ආ) ඔහු විසින් ලියන ලද ස්වයා චරිතාපදානය කුමක් ද?

(iii) ''මස් අවුළු ආදියත් කෑ නො දෙම්හ.''

(අ) ඉහත ප්‍රකාශය ඇතුළත් වන කෘතිය කුමක් ද?

(ආ) ඉහත කොටස කවර උප මාතෘකාවක් යටතේ ඇතුළත් වේ ද?

(iv) නුදුරු රුව සිහි ලැලීය ගඟුලැ ලීය
වට සැදි මල් වැලීය සුදු වැ ලීය
..............................................................
තුටු වන සිතිවිලිය පුල් වි ලීය

(අ) හිස් පද පේළිය සම්පූර්ණ කරන්න.

(ආ) මේ කවිය ඇතුළත් නිර්දිෂ්ට කොටසේ මාතෘකාව ලියන්න.

(v) ''කෙල්ලෙ මේ මහත්තයට වතුර පනිට්ටුනක් ගෙනත් දීපිය...''

(අ) මෙහි කියැවෙන 'කෙල්ල' කාගේ කවු ද?

(ආ) මීට අදාළ පාඩම කුමක් ද?

(vi) අනුවණකම් කළේ
ගුරුන් ගුණ සිහි නොකළේ
නද ඉන් නො පත ළේ
අයසමය මුළු දියත පතළේ

(අ) මෙහි කියන පරිදි නද ඉන් නො පතළේ ඇයි?

(ආ) මේ අවස්ථාවට සම්බන්ධ වන්නේ කවරහු ද?

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

(vii) ''මහණ, එමග නොයා''

(අ) මේ ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දක් ද?
(ආ) එමග නොයෑමට කීවේ කවර හේතුවක් කරණ කොට ගෙන ද?

(viii) නිල තුරඟුට නැගෙමින් රිවිදෙව් සිරිත
දුල කැරැ සේසත් මිණි බරණ කිරණින

..........................................................................................

..........................................................................................

(අ) මේ පද්‍යයෙන් කියැවෙන ඓතිහාසික සිද්ධිය කුමක් ද?
(ආ) එම සිද්ධිය ප්‍රකාශ වන හිස් පද පේළි පුරවන්න.

(ix) (අ) 'සක්වාලිහිණි, ප්‍රබුද්ධ' යන කාව්‍ය කෘතිවල කතුවරයා නම් කරන්න.
(ආ) සාහිත්‍ය පාඨ සංග්‍රයට ඇතුළත් වන්නේ එම කතුවරයාගේ කවර නිර්මාණය ද?

(x) (අ) 'සිලිදු' චරිතය ඇතුළත් වන්නේ කිනම් නිර්දිෂ්ට කොටසෙහි ද?
(ආ) සිලිදුට පිවිතාන්තය දක්වා සිරදඬුවම් නියම වන්නේ ඇයි?

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) වල දින අදහසින් මෙන් සුර ගඟ අඟන
නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන
වෙල ළස ගැවැසි මුතු සක් පබළු බබළන
බල මහ මුහුද එම සදෑ උතුරින් පෙනෙන

(අ) ඉහත අයුරින් කතුවරයා විසින් අණ කරනු ලබන්නේ කාහට ද?
(ආ) සුළඟේ වේගයෙන් වංචල වන්නා වූ රළ අහසට නැගෙන අයුරු කවියා දුටුවේ කෙසේද?

(ii) මේ පරස්පර විරෝධීභාවයෙන් මා තුළ විමතියක් හට ගත්තෙන් මම පාසලේ උගත් කරුණු ගැන අම්මාට කිවෙමි
(අ) ඉහත සිද්ධිය කෙටියෙන් හඳුන්වන්න.
(ආ) මෙහි සඳහන් පරස්පර විරෝධීභාවය කුමක් ද?

(iii) ''එක් දවසක් තුමූ අලුයම් වේලෙහි පිබිද, සුවඳ තෙලෙහි නගන ලද පහන් ආලෝකයෙන් ගන්ධදාම පුෂ්පදාමවලම්බිත නානා වර්ණ විචිත්‍ර විතානෝපලක්ෂිත අලංකෘත ශ්‍රී යහන් ගර්භය බලන්නාහු මහත් වූ සම්පත් දැක...''
(අ) ඉහත සිද්ධිය කෙටියෙන් දක්වන්න.
(ආ) තද කළු අකුරින් යුත් කොටස්වල අර්ථ දක්වන්න.

(iv) ''තුන් දුසිරින් දුරුව තුන් සුසිරි පුරා මතු මතුයෙහි ලැබිය යුතු ලොවි ලොවිතුරා ගුණ විශේෂයට පිහිට විය යුතු.''
(අ) ඉහත පද්‍යයෙන් ප්‍රකාශ වන්නේ කිනම් අවස්ථාවක් ගැන ද?
(ආ) මින් ප්‍රකට වන විශේෂ කරුණ කුමක් ද?

(v) ''මෑණියන් වහන්ස, මා දන්නේ මෙපමණෙක්ම ය. ඉදින් නුඹ වහන්සේ අමුත්තන් දන්නා සේක් වී නම් **පසිඳුව මැනව.**''
(අ) තද කළු අකුරින් යුත් පදවල අර්ථ ලියන්න.
(ආ) මේ සිද්ධිය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් දක්වන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

03. වෛදේහ රජුගේ මියුලු නුවර ආරක්ෂා වූයේ මහෞෂධ පඬිතුමාගේ

(i) උපා නැණ මහිමය කරණ කොට ගෙන ය.
(ii) ප්‍රඥා මහිමය කරණකොට ගෙන ය.

ඉහත ප්‍රකාශ පිළිබඳ ඔබේ අදහස් නියමිත කොටසින් නිදසුන් දෙක බැගින් වන සේ ඉදිරිපත් කර සාකච්ඡාවට භාජනය කරන්න.

**නැතහොත්**

ගුත්තිල නාට්‍යය

(i) සරල ජන වහරත්
(ii) සම්භාව්‍ය වියත් වහරත් සංකලනයෙන් නිපැයුණු හරවත් හා රසවත් නිර්මාථයක් බව නියමිත කොටසින් නිදසුන් දෙකක් බැවින් වන සේ තෝරා ගෙන විස්තර කරන්න.

04. (i) සතුන් මෙන් ම (ද්‍යද්‍ය) ගහ කොළ ද ඇතුළු පරිසරය වැසි සමය හේතු කොට ගෙන ඔය දියෙන් විචිත්‍ර වී ගිය ආකාරය පාඨක සිතට දැනෙන සේ ඉදිරිපත් කිරීමට **වස්සානය** කතුවරයා සමත් ව ඇති අයුරු නිදසුන් දෙක බැගින් වන සේ උපුටා ගෙන සාකච්ඡා කරන්න.

**නැතහොත්**

(ii) භාෂා භාවිතයත් (ද්‍යද්‍ය) ජීවන දැක්මත් නිසා 'ගංගාවේ සංගීතය' පද්‍ය පෙළ සාර්ථක වී ඇත. නිදසුන් දෙක බැගින් තෝරා ගෙන මේ ප්‍රකාශයට පක්ෂ ව කරුණු දක්වන්න.

05. 'උග්ගස්සේන සිටු පුත්හුගේ වස්තුව' මගින්

(i) ගැළපෙන ජිවිකා වෘත්තියක් තෝරා ගැනීම
(ii) වැඩිහිටි උපදෙස් ආදියට මූලිකත්වය දීම.

යන මාර්ගෝපදේශන පිළිබඳ ව අවධාරණය කර තිබේ. මේ එකිනෙක අදහස සදහා නිදර්ශන අවස්ථා දෙක බැගින්වත් ඉදිරිපත් කර ඔබේ අදහස් දක්වන්න.

06. සිංහබාහු නාට්‍යයේ එන 'සුප්පාදේවිය'

(i) විටෙක දයාබර මවකි.
(ii) විටෙක දයාබර භාර්යාවකි.

ඉහත ප්‍රකාශවලට අදාළ නිදසුන් දෙකක් බැගින් අදාළ නිර්දිෂ්ට කොටසින් උපුටා ගෙන වූ පිළිබද ව විමංසනයක යෙදෙන්න.